**සීමා සහිත ඩිස්ටන්ස් ලර්නින් සෙන්ටර් සමාගම - 2019**

**සීමා සහිත ඩිස්ටන්ස් ලර්නින් සෙන්ටර් ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ.**

**1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍වයක් විසින්ම එම අස්ථිත්‍වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍වවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.**

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්ව ඇත.**
**2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය අනුව ශේෂ පත්‍ර දිනට පසු මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතුය.**

**2.1 මූල්‍ය ප්‍රකාශන**

**2.1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ සඳහන් දිනය වන විටත් භාර දී නොතිබුනි. | අමාත්‍යාංශයේ යෝජිත නියෝජිතයින් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කරන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට දන්වා තිබුනද DLC හි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම තවමත් අවසන් කර නොමැත. එම නිසා 2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නව අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වන තුරු ලබා ගැනීමට නොහැකි වී ඇත.<br><br>කෙසේ වුවද, 2019 වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ව්‍යවස්ථාපිත දිනය වන 2020 පෙබරවාරි 28 දිනට පෙර රේඛීය අමාත්‍යාංශයට හා විගණකාධිපති වෙත සමාගම විසින් දැනටමත් භාර දී ඇත. | මූල්‍ය ප්‍රකාශන භාර දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අදාල සියළු අනුකූල නොවීම් මෙම මාතෘකාව යටතේ දක්වනු ලැබේ.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය | නිසි අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව දිරි දීමනා පටිපාටි කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා ලෙස රු.632,539ක් සමාගම විසින් ගෙවා තිබුණි. | DLC විසින් දිරිදීමනා පටිපාටි කිහිපයක් ක්‍රියාත්මක නොකරන අතර 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉලක්ක මත පදනම් වූ දිරිදීමනා පරිපාටියක් (TBSI) පමණක් ක්‍රියාත්මක කරනු ලැබේ.<br>සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සේවකයන්ට සුදුසු ලෙස වැටුප් ගෙවීමේ බලතල DLC සතුව පවතින අතර (සාංගමික ව්‍යවස්ථාවලිය 12 වගන්තිය) සමාගම විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මට්ටමින් මෙම අවශ්‍යතා සමඟ අනුකූල වන්නේදැයි අධීක්ෂණය කරනු ලැබේ. | අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් දිරිදීමනා සඳහා ගෙවීම් සිදුකළ යුතුය. |
| (ii) 2015 මැයි 25 දිනැති අංක PED/2015/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3.1 වගන්තිය | ප්‍රධාන විධායක නිලධාරී සඳහා අනුමත උපරිම මාසික ඉන්ධන සීමාව ලීටර 150කි. එසේවුවද සමාගම විසින් 2013 වර්ෂයේ සිට ප්‍රධාන විධායක නිලධාරී සඳහා ලීටර 193ක මාසික ඉන්ධන දීමනාවක් අනුමත සීමාවන් ඉක්මවා ගෙවා ඇත.සමාලෝචිත වර්ෂයේ අනුමත සීමාවන් ඉක්මවා ගෙවා තිබුනු වටිනාකම රු.60,000ක් විය. | ප්‍රධාන විධායක නිලධාරීගේ පත්වීම් ලිපියේ ඉන්ධන දීමනාව හා වාහන කුලිය සඳහන්ව ඇත. මෙම පත්වීම් ලිපිය සමාගම් සඳහා නිර්දේශ කර ඇති සාප්පු හා කාර්යාල පනතට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ නිකුත් කර ඇත. එම නිසා එම පත්වීම් ලිපිය නෛතික ලියවිල්ලක් බැවින් අප විසින් ඉහත අනුමත ඉන්ධන දීමනාව අඛණ්ඩව ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ඉන්ධන දීමනාව ලබාදිය යුතුය. |

**2.3. ප්‍රසම්පාදන කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 වගන්තිය අනුව ආයතනය විසින් අඩුම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු දක්වමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් (MPP) සකස් කර නොතිබුණි | සමාගම වසර 03ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති බවට එකඟ වෙමි. 2021 වර්ෂයේදී මෙය ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වෙමු. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.4. අධිකාරී බලය නොලත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස, | | |
| (i) 2019 මාර්තු 26 සිට මාර්තු 28 දක්වා චීනයේ බීජිං නුවර පැවති GDLN ආසියා පැසිපික් කලාප රැස්වීමට සහභාගී වූ නිලධාරීන් දෙදෙනෙකු සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු.85,540ක අතිරේක දීමනාවක් ගෙවා තිබුණි. | 188 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අනුව චීනයේ බීජිං නුවර පැවති ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ ආසියා පැසිපික් කලාප රැස්වීමට සහභාගී වීමට දින 4ක් සඳහා වියදම් අනුමත කරවාගෙන තිබුණි.කෙසේ වුවද ගුවන් ටිකට්පත් වලට අනුව මුළු දින ගණන දින 6ක් විය.(මාර්තු 25 සිට 30 දක්වා) එම නිසා ප්රධාන විධායක නිලධාරි විසින් දින 5ක නවාතැන් සඳහා වියදම් හා දින 6ක අන්තර් දීමනාවක් සඳහා අනුමැතිය ඉල්ලමින් සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කර තිබුණි.කෙසේ වුවද මෙය රැස්වීම් වාර්තා වල ඇතුලත් නොවන අතර නව අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙය නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ | විදේශ ගමන් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) 2019 සැප්තැම්බර් 02 සිට 03 දක්වා කොරියාවේ සෝල් නුවර පැවති GDLN ගෝලීය පාලක සභා රැස්වීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි සහභාගී වී තිබුණි.ඇරයුම් ලිපිය අනුව KDI පාසල විසින් ප්‍රවාහනය සපයන බව දක්වා තිබුනත් ඉන්චොන් | GDLN ඇරයුම් ලිපියෙහි ඉන්චොන් ගුවන් තොටුපල සිට හෝටලය දක්වා වූ ප්‍රවාහන වියදම ගෙවන බවට දක්වා තිබුණි.කෙසේ වුවද මෙය බස්රථ මඟින් සිදු කරන පොදු ප්‍රවාහනයට සීමා කර තිබුණි.අප විසින් ගුවන්තොටුපළ ප්‍රවාහන කුළී රථ සේවාව භාවිතා කල නිසා හෝටලය | සමාගමේ අනවශ්‍ය ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගුවන් තොටුපල සිට හෝටලය දක්වා ගමනාගමනය වෙනුවෙන් රු.24,900ක් ගෙවා තිබුණි. | දක්වා සහ නැවත ගුවන් තොටුපල වෙත සිදු කල ප්‍රවාහන වියදම අප හට දැරීමට සිදු විය. එම නිසා ඉන්චොන් ගුවන් තොටුපල සිට හෝටලය දක්වා සහ නැවත පැමිණීම සඳහා කුලී රථ වියදම ලෙස රු.24,900ක් ගෙවා තිබුණි | |

**2.4.** මානව සම්පත් කළමණාකරණය
------------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (අ) වගන්තියට අනුව සංවිධාන සටහන හා කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය.කෙසේ වුවද, ආයතනය මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. | රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සංවිධාන සටහන හා අනෙකුත් තොරතුරු ලබා දෙන ලෙස DLC වෙතින් කරන ලද ඉල්ලීමට අනුව DLC විසින් කාර්ය මණ්ඩලය, සංවිධාන සටහන, පත්වීම් ලිපි හා අනෙකුත් තොරතුරු 2019 ඔක්තෝබර් 8 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. මේ ලියවිලි සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් වැඩි දුර ප්‍රතිචාරයක් ලැබී නැත. මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුව සමඟ රැස්වීමක් සංවිධානය කරන ලෙස රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. | සමාගම විසින් චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| **(ii) 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව සෑම රාජ්‍ය ව්‍යාපාරයකටම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් පැවතිය යුතු නමුත්, සමාගම සතුව එවන් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් නොතිබුණි.** | 2017 නොවැම්බර් 29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ මූලික රැස්වීමක් එහි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ කාමරයේ පැවැත්වීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදි. කෙසේ වුවද ඉහත රැස්වීමේ සාකච්ඡා වූ ප්‍රතිඵලය සම්බන්ධ ප්‍රතිචාර ලිපියක් DLC වෙත ලැබී නොතිබුණි. එමනිසා ඉහත කාරණාව සම්බන්ධයෙන් පසුගිය වර්ෂ තුනක කාලය තුල අප විසින් වරින් වර රේඛීය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලිඛිත දැනුම්දීම් සිදු කර ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් බඳවාගැනීමේ පටිපාටිය හා කාර්යමණ්ඩල විස්තර 2019/05/29 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. 2017 නොවැම්බර් 29 දින පැවති ඉහත රැස්වීම සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් රේඛීය අමාත්‍යාංශයට යවා ඇති බවට පසුගිය වර අප විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ පැවති සාකච්ඡාවේදී දැනුම් දෙන ලදි. එම ලිපියේ දැක්වෙන ආකාරයට "DLC සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවාගැනීමේ පටිපාටිය හා කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීම අවශ්‍ය නොවේ. "(2017.12.12 දිනැති අංක DMS/DLC/T දරන ලිපිය) | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ආයතනය කටයුතු කළ යුතුය. |